# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,896 - 2015 ජනවාරි මස 02 වැනි සිකුරාදා - 2015.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅා) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 22 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 23 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 23 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 28 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජනවාරි මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජනවාරි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## මඩකලපුව මහාධිකරණය

**අධිකරණ භාරයට ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද මෝටර් රථ මුද්‍රා තැබූ මිල ගණන් කැඳවා විකිණීම පිණිස මඩකලපුව මහාධිකරණය විසින් ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම - 2015**

වාලච්චේන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය විසින් අත්පත් කර ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද ලොරි රථයක්, ට්‍රැක්ටර් රථයක් සහ යතුරුපැදි එකක් ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම යටතේ විකිණීමට තිබේ. මේ සඳහා වූ ඉල්ලුම්පත්‍ර 2015 ජනවාරි 21 වැනි දින ප. ව. 3.00 දක්වා භාරගනු ලැබේ.

සියලු ඉල්ලුම්පත්‍ර මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, මඩකලපුව, යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු ය. එසේ නැතිනම් මහාධිකරණ ගිණුම් අංශයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතු ය. ඉල්ලුම්පත්‍ර යැවීමේ දී ලියුම් කවරයේ ඉහළ කොටසේ "වාලච්චේන දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් අත්පත් කර ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ සන්තක කරන ලද වාහන සඳහා ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

මහාධිකරණ මුද්‍රාව හා මහාධිකරණ ගණකාධිකාරිතැනගේ අත්සන සහිත ඉල්ලුම්පත්‍ර පමණක් පාවිච්චි කළ යුතු ය.

මෙලෙස ටෙන්ඩර් පත්‍රිකා මගින් විකිණීමට තීරණය කර ඇති වාහනවල අයිතිය ඉල්ලන කවුරු හෝ සිටියි නම්, ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම අවසාන දින ප. ව. 3.00 ට පෙර ලේඛන සහිතව තමන්ගේ අයිතිය ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලක් නොදක්වන බවත් දන්වා සිටිමු.

එක් එක් ලොරි රථ, ට්‍රැක්ටර් රථ හා යතුරුපැදි සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. ඒ සඳහා ආපසු නොගෙවනු ලබන රු. 1,00ක් සමග පහත පරිදි තැන්පත් මුදල් තැන්පත් කළ යුතු ය. මෙම ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම 2015 ජනවාරි මස 20 වැනි දින ප. ව. 3.00 ට අවසන් වනු ඇත.

| *අනු. අංක* | *වාහනයේ විස්තර* | *වාහනයේ වර්ගය* | *නඩු අංකය* | *විකිණීම සඳහා ලබාදෙන ලද අංක* | *තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|---|---|
| 1. | යතුරු පැදි 01 | Hero Honda CBZ MG - 4080 | B/310/07 | MC/VCH/01/2015 | 1,000 0 |
| 2. | ලොරි රථ 01 | Mitzubishi Model Cante 227 – 8640 | 16230/F/11 | MC/VCH/02/2105 | 5,000 0 |
| 3. | ට්‍රැක්ටර් රථ 01 | Mahendra Model 575DI 49-0182 | 16643/PC/11 | MC/VCH/03/2015 | 1,000 0 |

වලංගු කාලය තුළ ලැබෙන මුද්‍රා සහිත සියලු ඉල්ලුම්පත්‍ර 2015 ජනවාරි මස 21 වැනි දින ප. ව. 3.00 ට පැමිණ සිටින ඉල්ලුම්කරුවන් ඉදිරිපිට මහාධිකරණ සම්පාදන කමිටුව විසින් විවෘත කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා මගින් ඉහල මිලක් සඳහන් කොට ඉල්ලුම්කර ඇති ඉල්ලුම්කරුවන්ට එම වාහනය විකිණීමට මඩකලපුව මහාධිකරණ සම්පාදන කමිටුව අනුමැතිය ලබා දෙයි. ඒ අනුව ඉදිරි විකිණීම් කටයුතු අදාළ අධිකරණය විසින් සිදුකරනු ලැබේ.

ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට තීරණය කර ඇති වාහන කාර්යාල දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 2.30 දක්වා වූ කාලය තුළ අදාළ වාලච්චෙන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය ඇතිව නිරීක්ෂණය කළ හැකිය.

විකිණීමට තීරණය කර ඇති වාහන සඳහා තක්සේරු මිල ලබාගෙන ඇති බැවින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකාවල සඳහන් මිල තක්සේරු මිලට වඩා අඩුවෙන් පවතියි නම්, එම වාහන විකිණීම අත්හිටුවා දැමීමට ටෙන්ඩර් මණ්ඩලයට පූර්ණ බලය ඇත.

විකුණන ලද වාහන, මුදල් ගෙවා රිසිට්පත් ලබාගත් වහාම අධිකරණ භූමියෙන් ඉවත් කළ යුතු ය. එමෙන් ම සියලු ගෙවීම් මුදලින් සිදුකළ යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

ඉහත ටෙන්ඩර් මගින් සිදුකරන විකිණීම් පිළිබඳ අවසන් තීරණය ගැනීම මඩකලපුව සම්පාදන කමිටුව සතු ය.

මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
මඩකලපුව.

01-12

# බඩු බාහිරාදිය විකිණීම්

**මහාධිකරණය - කෑගල්ල**

වෙන්දේසි දිනය වෙනස් කිරීම පිළිබඳ දැන්වීමයි

අංක 1,891 පිටුව 2,124 1 කොටස : (11ආ) ජේදය 2014.11.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද ප්‍රසිද්ධ වෙන්දේසිය 2015.01.10 වැනි දින නොවැලැක්විය හැකි හේතුවක් මත නොපවත්වන බවත්, එකී වෙන්දේසිය 2015.01.24 වැනි දින පෙ. ව. 10.00 ට පැවැත්වීමට නියමිත බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. ඒ. ජී. ආර්. අමරසේකර,
මහාධිකරණ විනිසුරු- කෑගල්ල.

2014 දෙසැම්බර් මස 10 වැනි දින,
කෑගල්ල මහාධිකරණයේ දී ය.

01-14

---

# රජයේ නොවන දැන්වීම්

**ප්‍රසිද්ධ දැන්වීම**

ප්‍රසිද්ධ සමාගමක් බවට පරිවර්තනය වීමත් සමග නම වෙනස් කිරීම

බොරලැස්ගමුව වේරහැර, කිරිමැටි පිරිපහදු පාරේ, අංක 184/2 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි, 1982 අංක 17 දරන සමාගම් පනතෙහි විධිවිධාන ප්‍රකාරව සංස්ථාපනය කරන ලද කොන්සොලිඩේටඩ් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය (සමාගම් ලියාපදිංචි අංකය පී වී 5851) පනතෙහි 28 වැනි වගන්තිය ප්‍රකාරව 2014 නොවැම්බර් මස 03 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි ප්‍රසිද්ධ සමාගමක් බවට පරිවර්තනය කරනු ලැබූ බවත් පනතෙහි 11 (2) වගන්තිය අනුව එම ආයතනයේ නම කොන්සොලිඩේටඩ් බිස්නස් සිස්ටම්ස් ලිමිටඩ් වශයෙන් වෙනස් කළ බවත් 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 11 (5) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,

අංක 184/2, කිරිමැටි පිරිපහදු පාර,
වේරහැර, බොරලැස්ගමුව.
2014 දෙසැම්බර් මස 05 වැනි දින.

01-75

---

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : එඩ්වයිස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 102631
සංස්ථාගත කළ දිනය : 2014.12.05
ලියාපදිංචි කාර්යාලය : අංක 92, පොල්ගොල්ලවත්ත, පොල්ගොල්ල

ලේකම්.

01-04

**නිවේදනයයි**

මෙම සමාගම 2014.12.09 වැනි දින සංස්ථාපිත කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : මයිආම් කන්ෆෙක්ෂනරිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 102689
සමාගම ලියාපදිංචි කළ දිනය : 2014.05.14
ලියාපදිංචි කාර්යාලය : අංක 1252, මාතලේ පාර, අලවතුගොඩ, මහනුවර

නීතිඥ ජේ. එම්. අස්රප්,
ලේකම්.

අංක 259,
මාතලේ පාර, අකුරණ.

01-74

---

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : කැන්ඩි කැලි ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 102632
සංස්ථාගත කළ දිනය : 2014.12.05
ලියාපදිංචි කාර්යාලය : අංක 3/1, නුවර පාර, කෙන්ගල්ල.

ලේකම්.

01-03

### ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම පිළිබඳ නිවේදනය

කොළඹ 09, දෙමටගොඩ, බේස්ලයින් පාරේ අංක 270/39 හි පදිංචි පහත අත්සන් කරන බුලත්සිංහලගේ නිදූෂන් නිලෝවන වන මම (ජා. හැ. අ. 821833752 V) ශ්‍රී ලංකා රජයට සහ එහි මහජනතාව වෙත දැනුම් දී සිටින වගනම්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඇඹුල්දෙණිය විසින් සහතික කරන ලද අංක 584 හා 2009.06.20 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටොර්නි බලකරු වශයෙන් හෙට්ටිගොඩ, පිට්පන (උතුර) හෝමාගම, ගොඩගම අංක 284 7/1 හි පදිංචි මොරටුවගේ චම්පා (ජා. හැ. අ. 63844183 V) වෙත කරන ලද පත්කිරීම මෙහි සඳහන් දින සිට අවලංගු කරනු ලබන බවත්, එකී මොරටුවගේ චම්පා විසින් ඇතුළත් වන කිසියම් ගනුදෙනුවක් සඳහා මාගේ වගකීමක් නොමැති බව ය.

බුලත්සිංහලගේ නිදූෂන් නිලෝවන.

01-09

---

### දැන්වීමයි

බත්තරමුල්ල, ජයන්තිපුර, ලක්ෂපාන මාවත, අංක 7/1 හි පදිංචි ජා. හැ. අ. 756460307 V දරන නිරෝෂා දීපානී වික්‍රමසිංහ හෙවත් නීරෝෂා දීපානී ධර්මසේන වන මා විසින් කඩුවෙල, කොරතොට, අංක 275/1 හි පදිංචි ජා. හැ. අ. 680520089 V දරන වාසල මුදියන්සේලාගේ නිශ්ශංක වාසල බණ්ඩාර යන අයට දී තිබූ පී. ඒ. ජයරත්න කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද 2014 ජූලි මස 28 වැනි දින සහ අංක 810 දරන ඇටර්නි බලපත්‍රය අද පටන් බලරහිත ප්‍රත්‍යාදිෂ්ඨ සහ නිෂ්ප්‍රභා කරන බව මෙයින් දැනුම් දෙමි.

01-32

---

### මහජන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කරන නිවේදනය

සමාගමේ නම : පුල්සිත් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 100945
සංස්ථාගත කළ දිනය : 2014 සැප්තැම්බර් මස 18 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 76/3, පිළියන්දල පාර, මහරගම.

සමාගම් ලේකම්.

01-58

---

### මහජන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කරන නිවේදනය

සමාගමේ නම : ප්‍රෝලයින් ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 100944
සංස්ථාගත කළ දිනය : 2014 සැප්තැම්බර් මස 18 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 76/3, පිළියන්දල පාර, මහරගම.

සමාගම් ලේකම්.

01-57

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : කොලොම්බියා මරයින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : P V 102128
සංස්ථාගත කළ දිනය : 2014 නොවැම්බර් මස 13 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 265 ඒ, අත්තරකන්ද, කලහේ, වංචාවල, ගාල්ල.

ජයන්ති එච්. විතානාච්චි,
සමාගම් ලේකම්.

01-51

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රත්මලාන සිරිමල් උයන, රත්මල් මාවත, අංක 18 හි පදිංචි දකුණු ඕස්ට්‍රේලියාවේ, වෝල්ක්ලි හයිට්ස් බිස්නස් ඩ්‍රයිව් හි අංක 52 හි බාලගේ සමන්ති සධානා ධර්මබන්දු (විවාහයට පෙර) ද සිල්වා (ශ්‍රී ලංකා පාස්පෝට් අංක N 1859020) වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි පොදු ජනතාව වෙත මෙයින් දන්වා සිටින්නේ, මා විසින් කොළඹ 05, උද්‍යාන පාරේ අංක 351 දරන ස්ථානයේ පදිංචි මාගලගේ ජානකි ජසින්තා පෙරේරා (ජා. හැ. අංක 545562103 V) යන අයට බලය පවරන ලද වර්ෂ 2009 ජුනි මස 12 වැනි දින සකස් කරන ලද, දකුණු ඕස්ට්‍රේලියාවේ, ශ්‍රී ලංකා ජනරජ කොන්සල් ආනන්ද කේ. ඊරියගම සහතික කළ හා දිනපොත් අංක 4150 යටතේ 2009.06.30 වැනි දින ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය වහාම බලපවත්වන පරිදි මෙයින් අහෝසිකර අවලංගු කරන බවත්, එකී ඇටෝර්නි බලකාරිය සිදුකරන කිසිදු ගණුදෙනුවකට හෝ කටයුත්තකට මින් ඉදිරියට මා වග නොකියන බවත් ය.

බාලගේ සමන්ති සධානා ධර්මබන්දු (විවාහයට පෙර) ද සිල්වා.

01-46

---

### ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තියට අනුව වෙල්ටිස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2014.11.12 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : වෙල්ටිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 102078
ලියාපදිංචි ලිපිනය : අංක 29 ඒ, ඇල්බන්ස් පෙදෙස, කොළඹ 04.

ලේකම්.

01-44

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම පහත පළවේ.

සමාගමේ නාමය : සීඩා කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : P V 101589
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 62, වජිර පාර, කොළඹ 04
සංස්ථාගත කළ දිනය : 2014 ඔක්තෝබර් මස 20 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-43

---

## මහජන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කරන නිවේදනයයි

සමාගමේ නම : එම් ඒ බිල්ඩර්ස් ඇන්ඩ් ෆැබ්රිකේටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 101585
සංස්ථාගත කළ දිනය : 2014 ඔක්තෝබර් මස 20 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 10, දෙහිපිටිය, උකුවෙල.

සමාගම් ලේකම්.

01-59

---

## සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතෙහි 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගම් නාමය : ඕවර් ස්ටොක් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : 2014.11.03 වැනි දිනැති පී වී 101893
සමාගමෙහි ලියාපදිංචි ලිපිනය : අංක 05, චාර්ලස් පෙදෙස, කොළඹ 03

බිස්නස් මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරුන්.

2014 දෙසැම්බර් මස 22 වැනි දින,
අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02

01-76

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : රෙඩ්ලයින්ලොජිස්ටික්ස් පුද්ගලික සමාගම
ලියාපදිංචි කාර්යාලය : අංක 193/3, කොටිකාවත්ත, මුල්ලේරියාව, නව නගරය, කොළඹ
ලියාපදිංචි දිනය : 2014.11.18
ලියාපදිංචි අංකය : P V 102197

සමාගම් ලේකම්.

01-87

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ජාඇල, කොටුගොඩ, ඉසුරු උයන හි පදිංචි පිලිප්පු මණ්ඩඩිගේ ඇලෙක්සැන්ඩර් ප්‍රේමලාල් තිසේරා වන මම ඩී. සී. මල්ලිකා ගුණතිලක නොතාරිස් විසින් 2011.11.04 වැනි දින අංක 445 හි සහතික කොට ඇති අඟුරුවාතොට, දෙල්ගොඩ, අංක 28/B හි පදිංචි පිලිප්පු මණ්ඩඩිගේ පිදේලිස් එග්බර්ඩ් තිසෝරා වෙත පවරන ලද ඇටෝර්නි බලය 2014.12.11 වැනි දින සිට අවලංගු කොට බලරහිත කරන ලද බව මෙයින් දන්වමු. ලැබේ.

01-93

---

## නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බවට නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සිලෝන් සැන්වුවරිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102417
ලියාපදිංචි කාර්යාලය අංක : 50, බාන්ස් පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි දිනය : 2014 නොවැම්බර් මස 26

සමාගම් ලේකම්.

01-94

---

## දැන්වීම

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : රෝයල් ජයන්ට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 99261
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 122, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ
ලියාපදිංචි දිනය : 2014.06.23

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

01-95

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ සියලු දෙනාගේ ම දැන ගැනීම පිණිස මෙසේ දැනුම් දෙනු ලැබේ.

ගාල්ල, චීන කොරටුව මැද පාර, අංක 57/2 හි පදිංචි, හෙට්ටි ආරච්චිගේ දොන් චන්ද්‍රලාල් ප්‍රියන්ත වන මා විසින් ගාල්ල, චීන කොරටුව මැද පාර, අංක 57/2 හි පදිංචි දෙල්පාගොඩගේ දයාවතී යන අය වෙත බලය පවරමින් ලියාපදිංචි කර ඇති ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩබ්. විතාරණ මහතා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 1997. 09.01 දිනැති අංක 1191 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගුකර ශුන්‍යකර බල රහිතකර සිටිමි.

මෙතැන් සිට එකී දෙල්පාගොඩගේ දයාවතී යන අය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ඇතුලත් වනු ලබන කිසිම ගිවිසුමක් සම්බන්ධයෙන් මා වගකියනු නොලබන බව ද මෙයින් දැනුම් දෙමි.

හෙට්ටි ආරච්චිගේ දොන් චන්ද්‍රලාල් ප්‍රියන්ත.

01-96

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 : 2 වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පූර්ව නාමය : පවර් ටෙක් ඉන්ජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 69165
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 231/2, ලංකා බැංකු ගොඩනැගිල්ල, කෙලින් වීදිය, බත්තරමුල්ල
සමාගමේ නව නාමය : එම්. එල්. විරා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
පූර්ව නාමය වෙනස් වූ දිනය : 2014 නොවැම්බර් මස 05 වැනි දින.

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-124

---

## ශ්‍රී ලංකා (පීවීටී) එල්ටීඩී

2007 අංක 7 දරන සමාගම් පනතේ 09 (01) වගන්තිය ප්‍රකාර සංස්ථාගත කිරීම් පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි.

ශ්‍රී ලංකා (පීවීටී) එල්ටීඩී නමින් නව සමාගමක් 2014 ඔක්තෝබර් මස 15 වැනි දින සිට සංස්ථාගත කරන ලද බව මෙයින් ප්‍රසිද්ධියේ දන්වා සිටිමු.

ලියාපදිංචි අංකය : පී වී 101519
සම සමාගමේ ලියාපදිංචි කාර්යාලය: අංක 79 ඒ, ධර්මපාල මාවත, කොළඹ 07.

සීමාසහිත ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්,
(නව සමාගම් සඳහා ලේකම්වරු.)

ස්ටුවට් හවුස්,
අංක 45, ජනාධිපති මාවත,
කොළඹ 01.

01-129

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

සමාගමේ නම : එක්සෙල් එන්ටප්‍රයිස් කොන්ක්‍රීට් නෙස්ට් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි ලිපිනය : පොත්තෙවෙල, බාඳුරාගොඩ
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 96318
සංස්ථාගත කළ දිනය : 2014.01.01

ලේකම්.

01-130

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2014 දෙසැම්බර් මස 04 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : රියල්ස්ටේට් ඉන්ටෙලිජන්ස් යුනිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102613
ලියාපදිංචි ලිපිනය : 3/1, අංක 39, ඇල්ෆ්‍රඩ් පෙදෙස, කොළඹ 03

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

චිරංගා රණසිංහ අමිර්තයියා,
ලේකම්.

01-133

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මොරටුව, කටුබැද්ද, සංචාරක ඩිපෝව පාර, අංක 260/14 දරන ස්ථානයේ පදිංචි උංගාමන්ඩඩිගේ ලිලි ආනන්දරාජා (වි. පෙ. ප්‍රනාන්දු) ජා. හැ. අංක 377411404 V වන මම මෙසේ ප්‍රකාශ කර සිටිමි.

ප්‍රසිද්ධ නොතාරිස් ජී. ජී. ඥාණසිරි සිල්වා විසින් 2013 මාර්තු මස 15 වැනි දින සහතික කරන ලද අංක 3701 දරන ඇටෝර්නි බල පත්‍රයෙන් මොරටුව ලක්ෂපතිය අර්නස්ට් පෙදෙසේ 1 වන පටුමග, අංක 5/1 දරන ස්ථානයේ පදිංචි උංගා මණ්ඩඩිගේ උපාලි රංජිත් ප්‍රනාන්දු ජා. හැ. අංක 433621141 V වෙත පවරා දී තිබූ ඇටෝර්නි බලපත්‍රය අද දින සිට මෙයින් අවලංගු කරන බවත් ඔහු විසින් මාගේ නමින් සහ මා වෙනුවෙන් සිදු කරන කිසිම ක්‍රියාවකට මෙතැන් සිට මා වග නොකියන බවටත් මෙයින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිමි.

ලිලි ආනන්දරාජා.

01-154

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : අයිකොන් මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102298
ලියාපදිංචි ලිපිනය : 2 වැනි මහල, මැක්ලරන්ස් ගොඩනැගිල්ල, අංක 123, බෞද්ධාලෝක මාවත, කොළඹ 04
සංස්ථාපනය කළ දිනය : 2014 නොවැම්බර් මස 20 වැනි දින.

සමාගම් ලේකම්.

01-160

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. සුනිල් ප්‍රේමවර්ධන විසින් 2001.04.30 වැනි දින ලියා සහතික කරන ලද අංක 9360 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් නුගේගොඩ, පාගොඩ පාරේ, හයවෙනි පටුමගෙහි අංක 9-37-10 දරන ස්ථානයේ පදිංචිව සිටි දැනට මහරගම, ඇල්හේන පාරේ අංක 83/1 දරන ස්ථානයේ පදිංචිව සිටින, සිඩ්නි ජෝර්ජ් අබේසුන්දර වීරසිංහ යන අයට පවරණ ලද ඇටෝර්නි බලය ද එකී ඇටෝර්නි බලපත්‍රය 2014.12.17 වැනි දින සිට අවලංගු හා බලරහිත කළ බව එකී ඇටෝර්නි බලපත්‍රයේ ඇටෝර්නි අධිපතිවරුන් වන දෙහිවල දුම්රියපොල පාරේ පී. ටී. ද සිල්වා මාවතේ, අංක 1/1 හි පදිංචිව සිටි දැනට පිළියන්දල සුවාරපොල සැන් බිෂෙල් පාරේ අංක 5/2 හි පදිංචිව සිටින කොන්ස්ටන්ස් කැතරින් ඉසබෙල් වීරසිංහ, චාල්ස් රුවන් විජය වීරසිංහ ඩැනියල් අතුර කොන්ස්ටන්ටයින් වීරසිංහ, ප්‍රීති විජයන්ති නියෝමි වීරසිංහ, දයානි අනෝමා සිසිලි වීරසිංහ සහ ඩේවිඩ් ලින් සනත් වීරසිංහ වන අප විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

01-161

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

වර්තමානයේ දී අංක 600, 3 වන මාවත, 12 වැනි මහල, නිව්යෝක්, NY 10016, ඇමෙරිකා එක්සත් ජනපදය, යන ලිපිනයේ පිහිටි ස්ටැක්ස් අයි එන් සී (Stax Inc) වන අප නිව්යෝක් ජනපදයේ කයිල් ඒ බ්‍රෝඩ්ස්කි සහ මැසචුසෙට්ස් ජනපදයේ ප්‍රසිද්ධ නොතාරිස් ක්‍රිස්ටින් ඒ. වෙන්සෙල් ඉදිරියේ දී අත්සන් කරන ලදුව අර්ජුන් කුමාර් විග්නරාජා සහ රුවිඳු මීමන පීරිස් යන අය වෙත 2010 දෙසැම්බර් මස 02 යන දාතමින් යුක්තව මා විසින් ප්‍රදානය කරන ලද ඇටර්නි බලය 2014 ඔක්තෝබර් මස 29 වැනි දින සිට බලපවත්වන පරිදි අහෝසි කර අවලංගු කරන බවත් පොදු මහජනතාව වෙත මෙලෙස දැනුම් දෙනු ලබන අතර එකී ඇටර්නි බලය එදින සිට ඉන් මතු ඉදිරියටත් අවලංගු වන බවත් නිශ්ප්‍රභා වන බවත් එමෙන් ම එය ශුන්‍ය හා බලරහිත වන බවත් මෙලෙස ප්‍රකාශ කර සිටිමු.

01-159

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

වේයන්ගොඩ රුක්මලේ ඔපත්ඇල්ල අංක 44 හි පදිංචි අංක 788173628 V දරන ජාතික හැඳුනුම්පත හිමි උපුලී ඉන්දිකා කස්තුරිආරච්චි වන මම බුත්පිටිය කිනිගම අංක 27 හි පදංචි අංක 753211993 V දරන ජාතික හැඳුනුම්පත හිමි මනමේන්ද්‍රගේ ඉන්දික පද්මලාල් මනමේන්ද්‍ර වෙත පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් එන්. එච්. කේ. ජී. පර්සි ද සිල්වා විසින් වර්ෂ 2007 ජනවාරි මස 8 වැනි දින ලියා සහතික කළ අංක 3196 දරන ඇටර්නි බලපත්‍රය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට එකී මනමේන්ද්‍රගේ ඉන්දික පද්මලාල් මනමේන්ද්‍ර වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බව ද දන්වා සිටිමි.

උපුලී ඉන්දිකා කස්තුරිආරච්චි.

01-166

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

සවුත් ඕස්ටේලියා, 5092, මොඩ්බරි හයිට්, ලේඩිවුඩ් රොඩ්, අංක 15/193 හි පදිංචි අංක N 2148470 දරන පාස්පෝට් අංකය හිමි ගයා සමුදුනී කෞෂල්‍යා ආටිගල වන මම පොල්ගස්ඕවිට, හොරතුඩුව, අංක 14 සී හි පදිංචි අංක 861610918 V දරන ජාතික හැඳුනුම්පත හිමි රහල් කුලප්‍රසාද් ආටිගල වෙත පවරන ලද වර්ෂ 2013.10.04 දිනැති විදේශ ඇටර්නි බලපත්‍රය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට එකී රහල් කුලප්‍රසාද් ආටිගල මා වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වෙග නොකියන බවද දන්වා සිටිමි.

ගයා සමුදුනී කෞෂල්‍යා ආටිගල.

01-167

---

## නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වන වගන්තිය යටතේ "ජ්ජීස් ෆන්ඩ් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන සමාගම 2014 දෙසැම්බර් මස 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි "ඇඩිෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" යනුවෙන් සිය සමාගම් නාමය වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නාමය : ජ්ජීස් ෆන්ඩ් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නාමය : ඇඩිෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 9306
සමාගමේ ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 53/2, බුත්ගමුව පාර, වැලිකඩ, රාජගිරිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සමාගම් ලේකම්.

01-179

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ දැන්වීමයි

සමාගමේ නම : මෙඩිවර්ත් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102223
ලියාපදිංචි කළ දිනය : 2014 නොවැම්බර් මස 18
ලියාපදිංචි ලිපිනය : අංක 80, හීරැස්සගල පාර, මහනුවර.

අධ්‍යක්ෂ මණ්ඩලය.

01-183

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුව කරන දැන්වීමයි.

ව්‍යාපාරයේ නම : මාර්ක් ප්‍රොඩක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 102835
ලියාපදිංචි කළ දිනය : 2014.12.16
ලිපිනය : අංක 1042 ඒ, කුමාරගේ වත්ත, තලංගම දකුණ, බත්තරමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලය.

01-202

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංකය : 71800233.

සී/ස රන්රුවන් (පුද්ගලික) සමාගමට අයත් උකස්කරන ලද දේපළ විකිණීම.

(2) ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ 2014.08.01 දිනැති අංක 1874 දරන *ගැසට් පත්‍රයේ* හා 2014 ජූලි 17 වැනි බ්‍රහස්පතින්දා දින ඩේලිනිවුස්, තිනකරන් හා දිනමිණ යන පුවත්පත් වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදී ම 2015.01.17 වැනි දින ප. ව. 2.00 ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එම් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

(1) එකී හෝකනදර ග්‍රාමයේ (ඔප්පුව ප්‍රකාර හෝකන්දර උතුර) පිහිටි "හොරගහවත්ත" නමැති ඉඩමේ ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ඇතුළත් වූ එකී අංක 3098 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3 උතුරට : එම ඉඩමේ ලොට් 1 ද, නැගෙනහිරට : අංක 1177 දරන පිඹුරෙහි ලොට් 6 ද, දකුණට අංක 1177 දරන පිඹුරෙහි ලොට් 9 (අඩි 15 පළල පාර) ද, බස්නාහිරට ලොට් 4 (අඩි 15 පාර සහ වටරවුම ද) මායිම්ව එකී අංක 3098 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් දාහතර (අ. 0, රූ. 1, පර්. 14) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 90/82 හි ලියාපදිංචි කර ඇත.

(2) එකී හෝකන්දර ග්‍රාමයේ පිහිටි "හොරගහවත්ත" නමැති ඉඩමේ අංක 3098 දරන එකී පිඹුරෙහි ලොට් 4 (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම මතින් පාරේ අයිතිය ද සහිතව එකී ලොට් 4 උතුරට : එම ඉඩමේ ලොට් 1 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 3 ද, දකුණට : අංක 1177 දරන පිඹුරෙහි ලොට් 9 (අඩි 15 පළල පාර) ද බස්නාහිරට : එම ඉඩමේ ලොට් 2 ද, මායිම්ව එකී අංක 3098 දරන පිඹුරට අනුව පර්චස් දහයයි දශම දෙකයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 10.20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 90/83 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙයට බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සාදන ලද 1999 ජූනි 6 දිනැති අංක 1177 දරන පිඹුරෙහි ලොට් 4, 5, 9 සහ 14 ලෙස දක්වා ඇති පාරට වෙන් කළ කොටස මතින් සහ ඒ දිගට පාරේ අයිතිය ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. එල්. ජී. නන්දසිරි මයා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
බම්බලපිටිය.

01-168

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංකය : 71800233.

සී/ස රන්රුවන් (පුද්ගලික) සමාගමට අයත් උකස්කරන ලද දේපළ විකිණීම.

(2) ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ 2014.08.01 දිනැති අංක 1874 දරන *ගැසට් පත්‍රයේ* හා 2014 ජූලි 17 වැනි බ්‍රහස්පතින්දා දින ඩේලිනිවුස්, තිනකරන් හා දිනමිණ යන පුවත්පත්වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදී ම 2015.01.17 වැනි දින ප. ව. 1.30 ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එම් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

(1) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ (අතුරුගිරිය ඒකකය) අංක 494/ඒ දරන හෝකන්දර බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හෝකන්දර ග්‍රාමයේ (ඔප්පුව ප්‍රකාර හෝකන්දර උතුර) පිහිටි "හොරගහවත්ත" නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සාදන ලද 2001 ජූනි 06 දිනැති අංක 3098 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට : එම ඉඩමේ ලොට් 1 ද, නැගෙනහිරට : එම ඉඩම් ලොට් 4 (අඩි 15ක් පළල පාර සහ වටරවුම) ද, දකුණට : පිඹුරු අංක 1177 හි ලොට් 9 (අඩි 15 පළල පාර) ද, බස්නාහිරට : පිඹුරු අංක 1177 හි ලොට් 8 ද, මායිම්ව එකී අංක 3098 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් දාහතරක (අ. 0, රූ. 1, පර්. 14) ක බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 84/33 හි ලියාපදිංචි කර ඇත.

(2) එකී හෝකන්දර ග්‍රාමයේ පිහිටි "හොරගහවත්ත" නමැති ඉඩමේ අංක 3098 දරන එකී පිඹුරෙහි ලොට් 4 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම මතින් පාරේ අයිතිය ද සහිතව එකී ලොට් 4, උතුරට : එම ඉඩමේ ලොට් 1 ද, නැගෙනහිරට : එම ඉඩම් ලොට් 3 ද, දකුණට : අංක 1177 දරන පිඹුරෙහි ලොට් 9 (අඩි 15 පළල පාර) ද බස්නාහිරට : එම ඉඩමේ ලොට් 2 ද, මායිම්ව එකී අංක 3098 දරන පිඹුරට අනුව පර්චස් දහයයි දශම දෙකයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 10.20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 90/83 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙයට බලයලත් මිනින්දෝරු එස්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් සාදන ලද 1999 ජුනි 6 දිනැති අංක 1177 දරන පිඹුරෙහි ලොට් 4, 5, 9 සහ 14 ලෙස දක්වා ඇති පාරට වෙන්කළ කොටස මතින් සහ ඒ දිගට පාරේ අයිතිය ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. එල්. ජී. නන්දසිරි මයා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
බම්බලපිටිය.

01-169

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංකය : 71800233.
සී/ස රන්රුවන් (පුද්ගලික) සමාගමට අයත් උකස්කරන ලද දේපළ විකිණීම.

(2) ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ 2014.08.01 දිනැති අංක 1874 දරන ගැසට් පත්‍රයේ හා 2014 ජූලි 17 වැනි බ්‍රහස්පතින්දා දින ඩේලිනිවුස්, තිනකරන් හා දිනමිණ යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදී ම 2015.01.17 වැනි දින පෙ. ව. 10.30 ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එම් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 489 දරන පෝරේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පෝරේ පිහිටි "දෙල්ගහවත්ත" සහ "ඇටඹගහලන්ද' නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඩී. එස්. එස්. කුරුප්පු විසින් සාදන ලද 1989 අගෝස්තු මස 6 දිනැති අංක 1021 දරන පිඹුරෙහි ලොට් ඒ ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් ඒ උතුරට : පාර ද, නැගෙනහිරට : ඊරියගහවිල කුඹුර ද දකුණට : ලොට් බී ද, බස්නාහිරට : ගම්සභා පාර ද, මායිම්ව එකී අංක 1021 දරන පිඹුරට අනුව රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) (එහෙත් රූඩ් දෙකයි පර්චස් නවයක් (අ. 0, රූ. 2, පර්. 9) ලෙස ලියාපදිංචිව ඇත) බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 80/66 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. එල්. ජී. නන්දසිරි මයා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
බම්බලපිටිය.

01-170

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් - පී. එල්. සී. පානදුර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර නගර සභා සීමාවේ නල්ලුරුව ශ්‍රී ඥාණරත්න මාවත දිගේ (කොට්ඨාස අංක 4 උයන් කැලේ) නල්ලුරුව (කොට්ඨාස අංක 5 මෝදරවිල) කළුදැවල (කොට්ඨාශ අංක 5 මෝදරවිල) සහ වෑකඩ (කොට්ඨාස අංක 5 මෝදරවිල) පිහිටි මෝදරවිල අරමුණුගහවෙල කැටකැලගහවත්ත සහ අරමුණුගහකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් 1992 අගෝස්තු මස 14 වැනි දින සාදන ලද පිඹුරු අංක 939 හි ලොට් 15 දරන ප්‍රමාණය :

අක්කර එකයි පර්චස් දාහතයි දශම එකයි හයක් (අ. 1, රූ. 0, පර්. 17.16) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගසකොළ වගාවන් සහ සියලු දේත් සමග වේ.

පහත සඳහන් ඉඩම මතුපිටින් ගමන් කිරීමේ අයිතිය ද සමග වේ.

ඉහත සඳහන් ශ්‍රී ඥානරත්න මාවත දිගේ පිහිටා ඇති මෝදරවිල අරමුණුගහවෙල කැටකැලගහවත්ත සහ අරමුණුගහකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් 1992 අගෝස්තු මස 14 වැනි දින සාදන ලද පිඹුරු අංක 939 ලොට් 5 දරන (පාරක් සඳහා වෙන්කරන ලද) ප්‍රමාණය : අක්කර එකයි පර්චස් තිස්පහයි දශම නවයයි එකක් (අ. 1, රූ. 0, පර්. 35.91)

පානදුර ගුණරත්න මාවතේ අංක 3 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නිත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වූ අයි. ඊ. ටෙක්නික්ස් (ප්‍රයිවට්) ලිමටඩ් ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී ට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2015ක් වූ ජනවාරි මස 29 වැනි දින පෙ.ව . 11.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.04.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රය*ද, 2014.09.24 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.01.02 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2015.01.06 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - පානදුර නගර මධ්‍යයේ ඇති ඔරලෝසු කණුව ලඟසිට කොළඹ - ගාල්ල ප්‍රධාන පාරේ ඔස්සේ ගාල්ල දෙසට කි. මී. 1.3ක් පමණ ගමන් කළ විට කර්මාන්තශාලා හංදිය හමුවේ. එම හංදියේ වමට ඇති ශ්‍රී ගුණරත්න මාවතේ මීටර් 400ක් ගොස් වමට හැරුණු විට අඩි 30 පළල වාහන ගමන් කළ හැකි නගර සභා පාරේ මීටර් 250ක් ගිය විට අදාළ දේපළ වන වරිපනම් අංක 45/5 වම්අත පැත්තේ පිහිටා ඇත. (ඊට විරුද්ධව පසින් අංක 3 දරන කොරියන් ස්පා කර්මාන්තශාලා පිහිටා ඇත)

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), 02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), 03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), 04. නොතාරිස් ගාස්තුව රු. 2,000, 05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, 06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, 07. ගැණුම්කරු විසින් අකාලිත වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතු ය. 08. ගැණුම මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දි 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ පානදුර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකර, උසාවි කොමසාරිස්,
182, 3 වැනි මහල, උසාවි පාර,
කොළඹ 12
දුරකථන/ෆැක්ස් අංකය : 011-2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 375,
ගාළු පාර,
පානදුර.
දුරකථන අංක : 038 - 2236808.
ෆැක්ස් අංකය : 038 - 2234167.

01 - 157

**සෙලාන් බැංකුව පීඑල්සී - බලංගොඩ ශාඛාව**

1990 අංක 04 රදන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ කොළඹ 08 පදිංචි වෛද්‍ය සංජය සේදර සෙනරත් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ හුණුපිටිය කොට්ඨාස අංක 23 කොම්පඤ්ඤවීදියේ, වොක්ෂොල් වීදියේ වරිපනම් අංක 234 පිහිටි බලයල්ත මිනින්දෝරු කේ. තිරුනාවුකරුසු විසින් සාදන ලද 1968.11.07 දිනැති (1966.11.01 වැනි දින ලෙස වැරදියට සඳහන් වී ඇති) අංක 443 දරන සැලැස්මේ නිරූපනය වන ඉඩමේ (1) බලයලත් මිනින්දෝරු එච්. ඩී. ඩයස් විසින් සාදන ලද 1921 ජූලි මස 16 දිනැති සැලැස්මේ නිරූපණය වන ලොට් "ඒ" සහ බලයලත් මිනින්දෝරු ෆ්‍රෙඩ් බර්තොලමියුස් විසින් සාදන ලද 1901.10.22 වැනි දිනැති සැලැස්මේ නිරූපනය වන ප්‍රදේශය යන සංසන්දනය කරන ලද ඉඩම් දෙකේ නැවත මැනීමක් වන එකී අංක 433 දරන සැලැස්මේ නිරූපනය වන) ලොට් 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 443 දරන සැලැස්ම අනුව පර්චස් තිහයි දශම නවයයි (අ. 0, රූ. 0, පර්. 30.9) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

මෑත මැනීමට අනුව ඉහත ඉඩම පහත දැක්වෙන ලෙස විස්තර කරනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ හුණුපිටිය කොට්ඨාස අංක 23 දරන කොම්පඤ්ඤවීදියේ, වොක්ෂෝල් වීදියේ, වරිපනම් අංක 234 හි පිහිටි බලයලත් මිනින්දෝරු එස්. අයි. පෙරේරා විසින සාදන ලද 1983 ජූලි මස 02 වැනි දිනැති අංක 965 දරන සැලැස්මේ නිරූපනය කර ලොට් 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 433 දරන සැලැස්ම අනුව පර්චස් තිහයි දශම නවයයි හතර (අ. 0, රූ. 0, පර්. 30.94) විශාල ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2015 ජනවාරි මස 29 වැනි දින පෙරවරු 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ කොටුවේ සිට චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත ඔස්සේ පැමිණ කිව් පාරට පිවිස එම මාර්ගයේ ඉදිරියට ගිය විට වොක්ෂෝල් වීදිය හමුවේ. වොක්ෂෝල් වීදිය ඔස්සේ හයිඩ් පාර්ක් දෙසට යන විට මාර්ගයේ දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත. ඩෝසන් විදියට හැරෙන ස්ථානයේ සිට මීටර් 50 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ හමුවේ.

*යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ* 2014.04.04, 2014.06.06 සහ 2014.06.27 වැනි දිනවල පළ වී ඇති අතර ලංකාදීප පුවත්පතේ 2014.04.07 වැනි දින සහ 2014.05.10 දින ද, ඩේලිමිරර් පුවත්පතේ 2014.04.07 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2014.04.04 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත්

ඕනෑම බද්දක්. 3. වෙන්දේසි කරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500 6. සියලුම ප්‍රචාරක වියදම්. ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.* - ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාළු පාර කොළඹ 03. දුරකථන අංක 011- 2456476, 2456480.

"ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක 011 - 3068185, 011 - 2572940.

01-63

---

### සෙලාන් බැංකුව පීඑල්සී - පානදුර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ වාද්දුව පදිංචි ගාල්ලගේ ලීලානන්ද පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ, වාද්දුව වස්කඩු දෙබැද්ද කුඩා වාද්දුව පිහිටි බලයලත් මිනින්දෝරු බී. එම්. එෆ් කල්දේරා විසින් සාදන ලද 1908 අගෝස්තු මස 20 දිනැති අංක 5836 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහවත්ත කොටස නමැති ඉඩම් කොටසට පර්චස් විසිනවයක් (අ. 0, රූ. 0, පර්. 29) විශාල ඉඩම.

පෙර කී කුඩා වාද්දුව පිහිටි එකී ඉඩම් කොටස බලයලත් මිනින්දෝරු ඊ. ඩී. ඊ. ඩබ්ලිව්. හේවදිකාරම් විසින් සාදන ලද 1982 ඔක්තෝබර් මස 12 දිනැති අංක 41 දරන සැලැස්මේ සඳහන් මෑතක මැනීමක් අනුව දෙල්ගහවත්ත කට්ටිය හෙවත් දෙල්ගහවත්තෙහි කැබලි අංක 1 සහ 2 ලකුණු කළ යාබද ඉඩම් කැබලි 2ක් සේ පෙන්නුම් කරනු ලබන අතර එකී අංක 41 දරන සැලැස්ම අනුව පර්චස් විසිහතයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 27.35) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2015 ජනවාරි මස 23 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ කොටුවේ සිට ගාළු පාර ඔස්සේ කි. මී. 33 ක පමණ දුරක් ගොස් වාද්දුව මංසන්ධිය දක්වා පැමිණ වම්පසට ඇති මාර්ගයට හැරෙන්න. එම මාර්ගය ඔස්සේ තවත් මීටර් 300 ක පමණ දුරක් ගිය විට දකුණු පසට ඇති විද්‍යාල මාවතට හැරී මීටර් 100 ක පමණ දුරක් ගිය විට මාර්ගයේ වම්පසින් අදාළ දේපළ එම මාර්ගයට මුහුණ ලා පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම. - *රජයේ ගැසට් පත්‍රයේ* 2007.04.20 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2007.03.08 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2007.03.14 වැනි දින වළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක් 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500 6. සියලුම ප්‍රචාරක වියදම්, ගැණුම් මිලෙන් ඉතිරි 90% ද, විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිනිය (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාළු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456473, 2456485.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක 011- 3068185, 011- 2572940.

01-64

---

### හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී - කල්මුණේ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, සහ කරෙයිවකු පත්තුවේ, කල්මුණේ ප්‍රාදේශීය සභා සීමාව තුළ කල්මුණේ මහ නගර සභා සීමාව තුළ මනෙයිකුදිරිප්පු පලෙයි පාරේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු

ටි. එළවරසු විසින් මැන සාදන ලද බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්චස් 7.34

*ඉඩමට ප්‍රවේශ මාර්ගය.-* බැංකුවේ සිට අක්කරෙයිපත්තු වීදියේ තාරව කෝවිල තෙක් පැමිණ වමට හැරී තාරව කෝවිල පාරට පිවිසෙන්න. එම පාර දිගේ විදුලිබල මණ්ඩලයේ හත්වෙනි අධිබල විදුලි කුළුණ තෙක් පැමිණි පසු අදාල දේපළ පාරේ දකුණු පැත්තේ පිහිටා ඇත.

මොහොමඩ් අලියාර් රවීයා සහ මොහොමඩ් ඊබ්‍රාහිම් කලීමුදීන් යන අයට ලබාදුන් මූල්‍ය පහසුකම් වෙනුවෙන් බැඳුම්කරුවන් වශයෙන් හැටන් නැෂනල් බැංකුව පී එල් සී වෙත උකස් කරන ලද දේපළ 2015 ජනවාරි මස 22 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 11.00 ට ආරම්භව පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014 ඔක්තෝබර් මස 24 වැනිදා රජයේ ගැසට් පත්‍රය සහ ඩේලිමිරර් ලක්බිම සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීම් කරන පිළිවෙල.-*

සාර්ථක ගැණුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු යි.

1. ගැණුම් මිලෙන් සියයට 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එක) දේශීය විකිණුම් බද්ද,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. වෙන්දේසිය සහතික කිරීම සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජයේ හෝ වෙනත් බල අධිකාරියක් මගින් පනවා ඇති වෙනත් ව්‍යවස්ථාපිත අය බදු තීරු බදු හෝ අයකිරීම් අදාල වේ නම් ඒවාද සමග වෙන්දේසි දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපි ලේඛන කොළඹ ටී බී ජයා මාවත, අංක 479, හැටන් නැෂනල් බැංකුව පී එල් සී, සාමාන්‍යාධිකාරී (නැවත අයකර ගැනීම්) වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය.

දුරකථන අංක : 011 2661816, ෆැක්ස් අංකය : 011 2661835.

ඩැලස් කෙලාව්,
බලයලත් වෙන්දේසිකරු.

අංක 146/3, කල්දේරා ගාඩ්න්ස් දුටුගැමුණු වීදියෙන් හැරී
කොහුවල.
දුරකථන අංක : 011 4302622, 011 4302623 ෆැක්ස් 2856013.

01- 171

---

## පොලිස් නිල සුනඛ කොට්ඨාසය

### පොලිස් නිල සුනඛයින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අයත් සේවයෙන් ඉවත් කළ නිල සුනඛයින් 08 දෙනකු 2015.01.17 වැනි දින පැය 09 00 ට මහනුවර අස්ගිරිය පොලිස් නිල සුනඛ මූලස්ථානයේ දී වෙන්දේසි කරනු ලැබේ.

මෙම නිල සුනඛයින් එදින උදේ පැය 0800 ට පරීක්ෂා කර බැලිය හැකි බව දන්වා සිටිමි.

| *අනු. අංකය* | *වර්ගය* | *පිරිමි* | *ගැහැණු* | *එකතුව* |
|---|---|---|---|---|
| 01. | ජර්මන් ෂෙපර්ඩ් | 01 | 02 | 03 |
| 02. | බෙල්ජියම් මැලනෝයිස් | 03 | - | 03 |
| 03. | ඩොබමන් පිනස්චර් | - | 01 | 01 |
| 04. | ලැබ්‍රඩෝර් රිට්රිවර් | 01 | - | 01 |
| | එකතුව | | | 08 |

සිසිර වීරකෝන්,
පොලිස් අධිකාරි.

2014 දෙසැම්බර් මස 17 වැනි දින,
පොලිස් නිල සුනඛ කොට්ඨාසය,
අස්ගිරිය, මහනුවර.

01-200

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජුරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| ජනවාරි | 2015.01.02 | සිකුරාදා | 2014.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.09 | සිකුරාදා | 2014.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.16 | සිකුරාදා | 2015.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.23 | සිකුරාදා | 2015.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.30 | සිකුරාදා | 2015.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2015.02.06 | සිකුරාදා | 2015.01.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.02.13 | සිකුරාදා | 2015.01.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.02.20 | සිකුරාදා | 2015.02.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.02.27 | සිකුරාදා | 2015.02.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2015.03.06 | සිකුරාදා | 2015.02.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.03.13 | සිකුරාදා | 2015.02.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.03.20 | සිකුරාදා | 2015.03.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.03.27 | සිකුරාදා | 2015.03.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2015 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.